**පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 476**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

# පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ
# දහහත්වැනි වාර්තාව

(2025.11.19 වැනි දින හා 2025.11.26 වැනි දින
ජාතික ඉතිරිකිරීමේ බැංකුව සම්බන්ධයෙන්
සිදුකරන ලද පරීක්ෂාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2026 පෙබරවාරි මස 19 වැනි දින ඉදිරිපත් කරන ලදී

*2026 පෙබරවාරි මස 19 වැනි දින*
*ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි*
*නියෝග කරන ලදී*

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය**

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., *( 2025.03.21 දින සිට)*
9. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., *(2025.05.20 දින සිට)*
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., *(2025.03.21 දින සිට)*
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., *(2025.05.08 දින සිට)*
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., *(2025.03.21 දින සිට)*

## කාරක සභාවේ උපදේශකවරුන්

- ❖ උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව } සරත් මායාදුන්නේ මහතා
- ❖ උපදේශක, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව - පියසේන රණසිංහ මහතා

## කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරී - එම්. එන්. පී. පෙරේරා මෙය

**කාරක සභා වාර්තා**

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

**පටුන**


| | | පිටු අංක |
|---|---|---|
| 1. | සභාපතිතුමාගේ සටහන | IV |
| 2. | විධායක සාරාංශය | V |
| 3. | දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහහත්වැනි වාර්තාව | VI |
| 4. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය | 1 |
| 5. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂා කරන ලද ආයතනය-  ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2 |

## සභාපතිතුමාගේ සටහන

පාර්ලිමේන්තුවේ විශේෂ කාර්යයන් සඳහා වන කාරක සභා යටතේ ස්ථාපිත, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2025.11.19 සහ 2025.11.26 යන දිනයන්හි දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතට ගැනෙන ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2022, 2023 වර්ෂවල විගණන වාර්තා පරීක්ෂා කිරීමට සහ එහි වත්මන් කාර්ය සාධනයට අදාළව සිදු කළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 1971 අංක 30 දරන පනත මගින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස පිහිටුවා ඇති අතර, බැංකුවේ දැක්ම, මෙහෙවර, අරමුණු, අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය, කාර්ය මණ්ඩලය, කාර්ය සාධනය සහ ණය කළඹ ආදී කරුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මෙහිදී ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාර්ය මණ්ඩලයට අදාළ නිලධාරීන් පිරිසක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමත්, එම පිරිස අතර සාමාන්‍යාධිකාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී හා ප්‍රධාන තොරතුරු නිලධාරී ඇතුළුව තවත් විධායක තනතුරු ඇතුළත් වීම පිළිබඳවත් අවධානය යොමු කළ කාරක සභාව, බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් හා මිනිස්බල සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. එමෙන්ම, බැංකුවේ ස්ථාවරත්වයට හානි විය හැකි පරිදි ස්ථිර කාර්ය මණ්ඩලය වසරින් වසර සංශෝධනය කිරීමකින් තොරව කටයුතු කිරීමේ වැදගත්කම මෙන්ම මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ස්ථාපනය කර තාක්ෂණික ගැටළු අවම කර පද්ධතිය පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කරන ලදී.

ණය කළඹ විශ්ලේෂණය කිරීමේදී බැංකුව විසින් ලබා දී ඇති ප්‍රධානම ආයතනික ණය වන RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමට ලබා දී ඇති ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 9ක සම්මේලනික ණය අය කර ගැනීමට අදාළව බැංකුව ක්‍රියා කර ඇති ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමු කළ කාරක සභාව, මෙහිදී බැංකුවේ නීති අංශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳවද අවධානය යොමු කරන ලදී. මෙම මාලදිවයින් සමාගම සම්බන්ධයෙන් වූ තොරතුරු, ණය ලබා දීමේ ක්‍රියාපටිපාටිය හා ණය ලබා දීමේදී එයට සම්බන්ධ වූ නිලධාරීන් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත්, මුදල් රෙගුලාසි 104ට අනුව රේඛීය අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමටත් නිර්දේශ ලබා දෙන ලදී. තවද, බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) හා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට (KDU) ලබා දී ඇති ණය අය කර ගැනීම සඳහා බැංකුව විසින් ගෙන ඇති පියවර සම්බන්ධයෙන්ද කාරක සභාව අවධානය යොමු කරන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, එම කාරක සභාවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් සහ කාරක සභාවේ උපදේශකවරු දෙදෙනාගෙන් ලැබෙන සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගෙන් සහ විගණකාධිපති ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහායත් අගය කොට සලකමි.

**වෛද්‍ය නිශාන්ත සමරවීර**
**සභාපති**
**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**

## විධායක සාරාංශය

2025.11.19 සහ 2025.11.26 යන දිනයන්හි දී පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්යසාධනය පිළිබඳව කරුණු පරීක්ෂා කරන ලද අතර එහිදී පහත සඳහන් කරුණු සඳහා අවධානය යොමු කරන ලදී.

- ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු
- අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය
- වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම
- බැංකුවේ කාර්ය මණ්ඩලය සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් හා මිනිස්බල සැලැස්මක් සකස් කිරීම
- කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් සේවයේ යෙදවීම හා සම්බන්ධ ගැටළු
- මධ්‍යගත බැංකුකරණ පද්ධතිය ස්ථාපනය කර තාක්ෂණික ගැටළු අවම කරගෙන එම පද්ධතිය පවත්වාගෙන යාම
- බැංකුවේ කාර්ය සාධනය හා අනුපාත විශ්ලේෂණය
- ණය කළඹ විශ්ලේෂණය හා අක්‍රීය ණය අය කර ගැනීම
- RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමට ලබා දී ඇති ණය අය කර ගැනීම
- බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) ලබා දී ඇති ණය සම්බන්ධයෙන් සලකා බැලීම
- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට (KDU) ලබා දී ඇති ණය
- අනෙකුත් ආයතනික ණය හා පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සම්බන්ධයෙන් තොරතුරු
- බැංකුවේ අස්ථානගත වූ ණය ලිපිගොනු පිළිබඳව කටයුතු කිරීම

**දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය**

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දහහත්වැනි වාර්තාව**

කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේදී 2025.11.26 දින දක්වා පහත ආයතන පරීක්ෂා කරන ලදී.

| අනු අංකය | කැඳවූ ආයතනය | කාරක සභාව පැවැත් වූ දිනය |
|---|---|---|
| 1. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.18 |
| 2. | ජාතික තරුණ සේවා සභාව | 2025.02.20 |
| 3. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.02.27 |
| 4. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.05 |
| 5. | ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 2025.03.12/ 2025.03.26 |
| 6. | ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 2025.03.27 |
| 7. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.04.02 |
| 8. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.05.08 |
| 9. | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම | 2025.05.09 |
| 10. | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 2025.05.15 |
| 11. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 2025.05.23 |
| 12. | ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය | 2025.06.04 |
| 13. | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 2025.06.20 |
| 14. | මහපොළ භාරකාර අරමුදල | 2025.07.09 |
| 15. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | 2025.07.17 |
| 16. | රාජ්‍ය දැව සංස්ථාව | 2025.07.23 |
| 17. | සිවිල් ගුවන් සේවා අධිකාරිය | 2025.08.20 |
| 18. | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 2025.09.10 |
| 19. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 2025.09.12 |
| 20. | ලංකා විදුලිබල මණ්ඩලය | 2025.09.24 |
| 21. | ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය | 2025.10.08 |

| | | |
|---|---|---|
| 22. | ලංකා සතොස ලිමිටඩ් | 2025.10.10 |
| 23. | ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්. හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම් | 2025.10.24 |
| 24. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.19 |
| 25. | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2025.11.26 |

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 462 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව- 2025.09.04 දිනට)

ඒ අතරින්, 2025.11.19 සහ 2025.11.26 යන දිනයන්හි දී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ 2022, 2023 වර්ෂවල විගණකාධිපති වාර්තා සහ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට කාරක සභාවේ නිරීක්ෂණ, නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2022 හා 2023 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

| ආයතනය | වර්ෂය | |
|---|---|---|
| | **2022** | **2023** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | **තත්ත්වාගණනය නොකළ මතය** | **තත්ත්වාගණනය නොකළ මතය** |

**විගණන මත වර්ග**

**01. තත්ත්වාගණනය නොකළ මතය (Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

**02. තත්ත්වාගණනය කළ මතය (Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

**03. මතය ව්‍යාවනය කිරීම (Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

**04. අහිතකර මතය (Adverse Opinion)**
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

***(මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය)***

**පරීක්ෂා කරන ලද දින - 2025.11.19 සහ 2025.11.26 දින**

**සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු**

### 01. බැංකුවේ සුවිශේෂී ලක්ෂණ

ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ සුවිශේෂත්වය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත අනුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි. එබැවින් වාණිජ බැංකුවකට ලබා දිය හැකි ණය වර්ග මෙම බැංකුවට ලබා දිය නොහැක. බැංකුවේ තැන්පතුවලින් අවම වශයෙන් 60% ක් භාණ්ඩාගාර බිල්පත්වල හා බැඳුම්කරවල ආයෝජනය කර ඉතිරිය පමණක් ණය ලබා දීමට හෝ වෙනත් ආයෝජන සඳහා යෙදවිය හැකිය. පාරිභෝගික ණය (retail lending) ලෙස නිවාස ණය හා පුද්ගලික ණය, බැංකුවට ලබා දිය හැකි නමුත්, පුද්ගලික ණය දීමේ අරමුණ ව්‍යාපාර කටයුතු සඳහා නොවිය යුතුය. වෙනත් බැංකු සමග සම්බන්ධ වී සම්මේලනික (syndicate) ක්‍රමයට පෞද්ගලික අංශයට ණය ලබා දිය හැකිය. එසේම ආයතනික ණය රජයේ ආයතනවලටද ලබා දිය හැකිය.

### 02. බැංකුව සම්බන්ධ පොදු කරුණු

ජාතික ඉතිරිකිරීමේ බැංකුව ස්ථාපනය කිරීම, දැක්ම, මෙහෙවර සහ බැංකුවේ අරමුණු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

#### 2.1 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පිළිබඳව ද සාකච්ඡා කළ කාරක සභාව, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නියමිත පරිදි පවත්වා ඇති බව නිරීක්ෂණය කළාය.

#### 2.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

2022 සහ 2023 වර්ෂ සඳහා වාර්ෂික වාර්තා පිළිවෙලින් 2023 නොවැම්බර් 29 සහ 2025 අප්‍රේල් 08 යන දිනයන්වලදීද, 2024 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව 2025.11.08 වන දින ද පාර්ලිමේන්තුවේ සභාගත කර තිබූ බව කාරක සභාවට අනාවරණය විය.

## 2.3 කාර්ය මණ්ඩලයේ සංයුතිය

මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාන්‍යාධිකාරීවරයා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී වන බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකු (SDGM) සාමාන්‍යාධිකාරීවරයාට ඔහුගේ රාජකාරි ඉටු කිරීමට සහාය වන බවත්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් එකොළොස් දෙනෙකු (11) අදාළ අංශයන්හි ප්‍රධානීන් ලෙස පත් කර ඇති බවත්, 2025 සැප්තැම්බර් 30 දිනට කාර්ය මණ්ඩලයේ තොරතුරු පහත පරිදි වන බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

| සේවක කාණ්ඩය | අනුමත | තත්‍ය කාර්ය මණ්ඩලය | | පුරප්පාඩු | (අතිරික්ත) |
|---|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | | |
| සාමාන්‍යාධිකාරී | 1 | | 1 | | |
| විධායක (111 ශ්‍රේණිය සහ ඊට ඉහළ) | 1503 | 1354 | 7 | 145 | (3) |
| කණිෂ්ඨ විධායක (IV ශ්‍රේණිය ) | 684 | 527 | - | 157 | - |
| මාණ්ඩලික සහකාර (V/VI ශ්‍රේණි) | 1946 | 1716 | 22 | 353 | (145) |
| සුළු සේවක (VII ශ්‍රේණිය) | - ------ | 592 -------- | - ---- | - ---- | (592) ------- |
| **එකතුව** | **4134** | **4189** | **30** | **655** | **(740)** |

### 2.3.1 සාමාන්‍යාධිකාරී තනතුර

ආයතනයේ සාමාන්‍යාධිකාරී තනතුර හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

සාමාන්‍යාධිකාරී තනතුර සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා නම් කළ ද, එම නිලධාරියා යෝග්‍ය හා සුදුසු බවට (fit and proper) ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අනුමැතිය ලබා නොදුන් බවත්, ඉන්පසුව මෙම තනතුර සඳහා බාහිරින්

සුදුසු නිලධාරියෙකු තෝරා පත් කර ගන්නා ලෙස දැන්වූ බැවින් වසර 03ක කොන්ත්‍රාත් පදනම මත දැනට සේවයේ නියුතු නිලධාරිනිය තෝරා පත් කර ගත් බවත්, ගණන්දීමේ නිලධාරි ප්‍රකාශ කළේය.

2018 වර්ෂයේදී T-24 නමැති මධ්‍යගත බැංකු පද්ධතියක් (centralized co-banking system) සකස් කිරීම පිළිබඳව හා බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරි (CIO) තනතුර සඳහා බඳවාගැනීමේ ක්‍රමවේදය පිළිබඳව ද කාරක සභාවේ අවධානය යොමු විය.

සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ 922/2017 ට අනුව මෙම ස්ථිර තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බාහිරින් බඳවාගැනීම වෙනුවට අභ්‍යන්තර බඳවා ගැනීමක් කිරීම සඳහා ප්‍රතිපාදන ඇති බැවින්, පුවත්පත් දැන්වීමක් පළ කිරීමට පෙර බැංකුව අභ්‍යන්තරයේ සිටින සුදුසු නිලධාරියකු බඳවාගැනීමට හැකියාව තිබූ බවත්, මෙම තනතුරේ සිටි නිලධාරියා තවත් මාස කිහිපයක් එම තනතුරෙහි රැඳී සිටි බැවින් නව බඳවා ගැනීම සඳහා අවශ්‍ය කාලය තිබූ බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

**2.3.2** <u>**බැංකුවේ කාර්ය මණ්ඩලයේ සේවක අතිරික්තය**</u>

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ කාර්ය මණ්ඩලයේ සේවක අතිරික්තය පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාවට, 2024 මාර්තු 22 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, I ශ්‍රේණිය සිට VI ශ්‍රේණිය දක්වා පමණක් සේවක සංඛ්‍යාව අනුමත කර ඇති බවත්, සුළු සේවක කාර්ය මණ්ඩලයේ 592 ක් සහ ලඝු ලේඛක/රහස්‍ය ලේකම්/යතුරු ලියනය කරන්නන් 148 දෙනෙක් (විධායක 03 ක් සහ මාණ්ඩලික සහකාර කාණ්ඩවල 145 ක් ඇතුළත්ව) 2024 වර්ෂයේදී අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. යම් ධාරාවන් වෙනස් කරන තෙක්, උසස්වීම් සම්පූර්ණ කරන තෙක් සහ හර බැංකුකරණය ක්‍රියාත්මක කරන තෙක් අතුරු පියවරක් ලෙස 2024 වර්ෂයේදී මෙම කාර්ය මණ්ඩලය අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර නොතිබුණ ද, මෙම කාණ්ඩ දෙක 2022 වර්ෂයේදී අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර තිබුණු බවත් කාරක සභාවට වැඩිදුරටත් නිරීක්ෂණය විය.

**2.3.3** <u>**බැංකුව විසින් කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් දෙදෙනෙකු බඳවාගැනීම**</u>

ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් 2024 ඔක්තෝබර් මස කොන්ත්‍රාත් පදනම මත ණය පරිපාලනය සහ ණය පාලනය (credit administration and credit

control) සඳහා නිලධාරින් දෙදෙනෙකු බඳවාගෙන ඇති බවත්, 2025 ඔක්තෝබර් මස (වසරකින් පමණ) ඉවත් වී ඇති බවත්, එම බඳවා ගැනීමේදී නිවැරදි බඳවා ගැනීමේ පටිපාටිය අනුගමනය කර නොමැති බවත්, ඉන් එක් අයෙකුට මසකට රු. 630,000 ක් වැනි ඉහළ වැටුපක් ගෙවා ඇති බවත්, මේ අනුව බැංකුවේ ණය අංශයේ හා නීති අංශයේ ගැටලුකාරී තත්ත්වයන් පවතින බවත්, උක්ත නිලධාරීන් දෙදෙනා ආයතනයෙන් ඉවත් වීමෙන් අනතුරුව වෙනත් නිලධාරීන් බඳවාගෙන නොමැති බවත් කාරක සභාවට අනාවරණය විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය හා වර්තමානයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීමට එකඟ වූ පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් 2025.12.15 දිනැතිව කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. 2024 වසරෙහි කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් දෙදෙනාගේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් හා එම බඳවා ගැනීම් මගින් බැංකුවට සිදු වූ සේවය සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

## 2.4 <u>බැංකුවේ කාර්ය සාධනය (අනුපාත විශ්ලේෂණය)</u>

බැංකුවේ අරමුණුවලට අනුව භාණ්ඩාගාර බිල්පත්වල හා භාණ්ඩාගාර බැඳුම්කරවල 60% ක අවම ආයෝජනයක් සිදු කළ යුතු බව 1971 අංක 30 දරන බැංකු පනතෙහි සඳහන් බව කාරක සභාවට නිරීක්ෂණය විය.

එමෙන්ම, ආදායම් වර්ධන අනුපාතය (%) 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ දී (10.5%)ක් වන බවත්, මෙම අගය සෘණ අගයක් වීම පිළිබඳවත් අවධානය යොමු විය. බැංකුවේ ආයෝජනවලින් 67.54% ක ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරවල යොදවා ඇති බවත්, භාණ්ඩාගාර බිල්පත්වලට ගෙවනු ලබන පොලී අනුපාත පහත වැටීම හේතුවෙන් බැංකුවේ ආදායම් වර්ධන අනුපාතය සෘණ අගයක් වීමට හේතු වී ඇති බවත්, භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර නැවත මිල කරන විට (re-price) මෙම තත්ත්වය වෙනස් වන නමුත්, ශුද්ධ පොලී ආන්තිකය (Net Interest Margin (NIM)) පමණක් බැංකුව විසින් කළමනාකරණය කරගෙන යන බවත් සාමාන්‍යාධිකාරීවරිය කාරක සභාවට පැවසුවාය.

## 2.5 ණය කළඹ විශ්ලේෂණය

2025 සැප්තැම්බර් 30 දිනට මෝටර් රථ ණය, ආයතනික ණය, නිවාස ණය, ස්ථාවර තැන්පතු මත ණය සහ පුද්ගලික ණය යන කාණ්ඩ යටතේ බැංකුවේ ණය කළඹ පවතින බවත්, 2025.09.30 දිනට පුද්ගලික ණය කාණ්ඩයට අදාළව අය විය යුතු වටිනාකම රු. මිලියන 202ක් වන බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

ණය කාණ්ඩවල සමස්ථ අයවිය යුතු ශේෂය රු. මිලියන 365,314.81 ක් වූ අතර, එයින් 9.44% ක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබෙන බවත්, පුද්ගලික ණයවල සමස්ථ අයවිය යුතු ශේෂය රු. මිලියන 201,951.29 ක් වූ අතර, එයින් 11.82% ක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබූ බවත්, ආයතනික ණයවල මුළු අයවිය යුතු ණය ශේෂය රුපියල් මිලියන 67,979 ක් වූ බවත්, එයින් 8% ක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබූ බවත් කාරක සභාවට හෙළි විය. මෙම අක්‍රීය ණය ශේෂයෙන් 78% ක් විදේශීය සමාගමක් වන RPI (Private) Limited සමාගමට ලබා දුන් ණයක් බවත්, 20% ක් භාණ්ඩාගාර ඇපකර මගින් සුරක්ෂිත කරන ලද රජයට සම්බන්ධ සමාගමක් වන ටෙක්නොපාර්ක් සංවර්ධන සමාගමට ලබා දුන් ණයක් බවත්, 2025 සැප්තැම්බර් 30 දිනට, වාහන ණයවල මුළු අයවිය යුතු ශේෂය රු. මිලියන 17.20 ක් වූ බවත්, එයින් 91.22% ක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබූ බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

2025 සැප්තැම්බර් 30 දිනට බැංකුව විසින් ප්‍රදානය කරන ලද රුපියල් මිලියන 5 ඉක්මවන ණයවල මුළු අයවිය යුතු ශේෂය රුපියල් මිලියන 96,046 ක් වූ බවත්, මෙම මුදලින් රුපියල් මිලියන 7,972.28 ක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබූ බවත්, මුළු අයවිය යුතු අක්‍රීය ණයවලින්, රුපියල් මිලියන 7,001.18 ක් වටිනා ණය පහසුකම් 84 ක් ඉහළම අවදානම් ශ්‍රේණිය යටතේ, එනම් "අලාභ" කාණ්ඩය යටතේ වර්ගීකරණය කර තිබූ බවත් කාරක සභාවට හෙළි විය.

පහත ආයතනවලට ලබා දී ඇති ආයතනික ණය සම්බන්ධයෙන් හා මෙම ණය අය කරගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

- RPI (Pvt) ltd. සමාගමට ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 9ක් ලබා දීම.

- ටෙක්නොපාර්ක් සංවර්ධන සමාගමට (Technopark Development Company) රු. මිලියන 750 ක් ලබා දීම.
- බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) 2016.06.17 දින රු. මිලියන 200 ක් හා 2019.04.24 දින රු. මිලියන 100 ක් ලබා දීම.
- ගල්කිස්ස මහ හෝටලයට රු. මිලියන 150ක් ලබා දීම.

### 2.5.1 බිම්පුත් ෆිනෑන්ස් සමාගමට (Bimputh Finance PLC) ණය ලබා දීම

බිම්පුත් ෆිනෑන්ස් සමාගම ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දෙන ආයතනයක් වන බැවින් එවැනි ආයතනයකට මෙම බැංකුව විසින් ණය ලබා දිය හැකිද යන්නත්, බිම්පුත් ෆිනෑන්ස් සමාගම දැනට පවතින්නේ ද යන්නත්, එම ආයතනයට පළමු ණය මුදල ලෙස 2016 වසරෙහි රු. මිලියන 200ක් ලබා දුන් පසු, 2019 වර්ෂයේදී දෙවැනි ණය මුදල ලබාදෙන අවස්ථාවේදී පළමු ණය මුදල පියවා තිබීම පිළිබඳව සලකා බැලුවේද යන්න හා එම රු. මිලියන 200 සඳහා ලබා දී ඇති ඇපකරය පිළිබඳවත් කාරක සභාව විමසුවාය.

බිම්පුත් ෆිනෑන්ස් සමාගම, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ණය ලබා දිය හැකි ආයතනයක් වන බවත්, ඔවුන්ට මෙම බැංකුවෙන් ණය ලබාගෙන තමන්ගේ ණය නැවත මූල්‍යකරණය (refinanace) කළ හැකි බවත්, සාමාන්‍යාධිකාරීවරිය ප්‍රකාශ කළාය.

මෙම ණය ලබා දීම සඳහා දයා ගෲප් සමාගම් සමූහය (Daya Group of Companies) විසින් ආයතනික ඇපකරය (corporate guarantee) ලබා දී ඇති බව බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති) ප්‍රකාශ කළාය.

බැංකුව මෙම ආයතනයට ලබා දී ඇති ණය ආපසු අය කර ගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාද වී ඇති බවත්, දයා ගෲප් සමාගම් සමූහය ඒ යටතේ ඇති ආයතනයකට ණය ලබා ගැනීමට ආයතනික ඇපකරයක් ලබා දී ඇති බවත්, ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දෙන ආයතනයකට මෙම ණය මුදල ලබා දීම මෙම බැංකුවේ අරමුණුවලට අනුව ගැටළු සහගත බවත්, මෙහිදී නොසැලකිලිමත්භාවයෙන් කටයුතු කිරීම පිළිබඳව බැංකුව හා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු බවත් අවධාරණය කළ කාරක සභාව මෙම ආයතනය ඇවර කිරීමේදී බැංකුවට යම් කොටසක් ලැබෙන්නේද යන්න විමසා සිටියාය.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් ගණන්දීමේ නිලධාරී ප්‍රකාශ කළේ මෙම සමාගම ඈවර කිරීමේදී ප්‍රමාද නොවී මේ සඳහා බැංකුවට සම්බන්ධ වීමට තිබූ බවත්, මේ වන විට එම අවස්ථාව අහිමි වී ඇති බවත් ය.

සමාගම පිළිබඳව තිබූ මූල්‍ය අවදානම (financial distress) හා අක්‍රීය ණය වැඩි ප්‍රමාණයක් තිබීම පිළිබඳව සඳහන් කර, අදාළ ණය මුදල ලබා දීමට පෙර වාර්තා කර ඇති පසුබිමක මෙම ණය මුදල ලබා දී ඇති බවත්, මෙම ආයතනයේ මුදල් ප්‍රවාහයෙහි (cash flow) අවදානමක් ඇති බැවින් ණය අය කිරීමේදී ගැටලු මතුවන බවත් වැ.බ විගණකාධිපතිවරයා සඳහන් කළේය.

### 2.5.2 <u>ස්ථාවර තැන්පතු මත ණය</u>

බැංකුව විසින් ස්ථාවර තැන්පතු මත ලබා දී ඇති ණය ආපසු ගෙවීමද පැහැර හැරීමක් සිදු වී ඇති බව හා ඒ යටතේ අක්‍රීය ණය ලෙස රු. මිලියන 69.23 ක් තිබෙන බව කාරක සභාවට නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් සාමාන්‍යාධිකාරීවරිය සඳහන් කළේ මෙහි අක්‍රීය ණය වශයෙන් සඳහන්ව ඇති නමුත් ඒවා අවදානම් ණය නොවන බවය.

### 2.5.3 <u>ටෙක්නොපාර්ක් සංවර්ධන සමාගමට (Technopark Development Company) ලබා දී ඇති ණය</u>

මෙම සමාගමට රු. මිලියන 750ක් ලබා දී ඇති බවත්, 2021 වර්ෂයේ අය වැය යෝජනාවට අනුව ශ්‍රී ලංකාවේ ස්ථාන කිහිපයක (කුරුණෑගල, ගාල්ල, මහනුවර, නුවරඑළිය) තොරතුරු තාක්ෂණ සේවා සැපයීම සඳහා ටෙක්නො පාර්ක් ඇති කිරීමට ව්‍යාපෘති අනුමත වී ඇති බවත්, මෙම ව්‍යාපෘති 2022 වර්ෂය වන විට නැවතී ඇති බවත්, ටෙක්නොපාර්ක් අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස් වී ඇති බවත්, ඒ වන විට තාක්ෂණ අමාත්‍යාංශය යටතට අයත් වූ මෙම සමාගම, මේ වන විට මුදල් අමාත්‍යාංශයට අයත් බවත්, මෙම ණය ස්වෛරීය ඇපකරයක් මත ලබා දී තිබූ බැවින් මහා භාණ්ඩාගාරය විසින් ගෙවීමට වගකීම භාර ගෙන ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

## 03. 2021 අගෝස්තු 06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

### 3.1 නිර්දේශ අංක 13

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට (KDU) ලබා දී ඇති ණය**

2013 වර්ෂයේදී බැංකුව විසින් ලබා ගෙන තිබූ ඇමරිකානු ඩොලර් මිලියන 750 ක බැඳුම්කරයක්, 2018 සැප්තැම්බර් 17 වන දින කල්පිරීමේදී ආපසු ගෙවිය යුතුව තිබුණි. බැංකුව විසින් මෙම බැඳුම්කරයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 201 ක ණය මුදලක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයට (KDU) ලබා දී තිබුණි. ලබා ගත් ණය මුදල ඉහත කල්පිරීමේදී ගෙවීමට විශ්ව විද්‍යාලයට නොහැකි වූ බැවින්, බැඳුම්කරයේ කොටසක් ආපසු ගෙවීම සඳහා බැංකුවට ජර්මනියේ කොමර්ස් බැංකුවෙන් වසර 3 ක කාලයක් සඳහා විචල්‍ය හා 2% පොළී අනුපාතයක් යටතේ ඇමරිකානු ඩොලර් මිලියන 100 ක තවත් විදේශ ණයක් ලබා ගැනීමට සිදු වූ බව කාරක සභාවට හෙළි විය.

මෙහිදී කිසිදු පැහැර හැරීමකින් තොරව බැංකුව මාසිකව අදාළ පොළී මුදල ගෙවා තිබුණු බව අනාවරණය වූ අතර, KDU ආයතනයට ලබා දී තිබූ ණය පහසුකම 2018, 2020 සහ 2024 වර්ෂ තුළ තුන් වරක් ප්‍රතිව්‍යුහගත කර තිබීම පිළිබඳවත්, කාරක සභාවේ අවධානය යොමු විය.

2025 මාර්තු 17 සහ 2025 සැප්තැම්බර් 17 යන දිනයන්හිදී පිළිවෙලින් රුපියල් මිලියන 4,137.32 ක් සහ රුපියල් මිලියන 3,917.39 ක් KDU විසින් ගෙවීම් කර ඇති බවත්, එම ණය මුදල ක්‍රියාකාරී ණය කාණ්ඩය තුළ ඇතුළත් වන බවත්, ජර්මනියේ කොමර්ස් බැංකුවෙන් ලබාගත් ණය මුදල බැංකුව විසින් සම්පූර්ණයෙන්ම පියවා තිබූ බවත් කාරක සභාවට නිරීක්ෂණය වූ අතර මෙම ණය මුදල KDU විසින් ගෙවීම පැහැර හැරිය පසු ගත් ක්‍රියාමාර්ග පිළිබඳව විමසුවාය.

මෙම ණය සඳහා භාණ්ඩාගාරයෙන් ඇපකරයක් ලබා දී ඇති බැවින් භාණ්ඩාගාරය විසින් සම්පූර්ණයෙන් ගෙවීම් කරන බවත්, ඒ සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ඉල්ලා ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

**3.2 <u>නිර්දේශ අංක 21</u>**

**<u>බැංකුවේ ස්ථිර කාර්ය මණ්ඩලය වසරින් වසර සංශෝධනය වීම</u>**

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගනිමින් බැංකුවේ ස්ථිර කාර්ය මණ්ඩලය වසරින් වසර සංශෝධනය කර ඇති බව කාරක සභාවට නිරීක්ෂණය වූ අතර, මේ සම්බන්ධයෙන් හේතු 2021 අගෝස්තු 06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී විමසා ඇති බවත්, බැංකුවේ වර්තමාන කාර්ය මණ්ඩල තනතුරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතර සංශෝධනය කරමින් අනුමත කිරීම බැංකුවේ ස්ථාවරත්වයට හානිකර බවත්, ඒ හේතුවෙන් යහපාලන පිළිවෙත් අනුගමනය කිරීම දුර්වල කරනු ලබන බවත් විගණන නිරීක්ෂණවල සඳහන් කර තිබීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු වූ අතර, බැංකුවේ පැවැත්මට සහ ස්ථාවරත්වයට හානිකර නොවන ලෙස බැංකුව කටයුතු කළ යුතු බව කාරක සභාවේ අදහස විය.

බැංකුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛවලින් නිදහස් කර තිබෙන්නේ කාර්යක්ෂම පරිපාලනයක් අපේක්ෂාවෙන් බවත්, 2021.08.06 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ද මේ සම්බන්ධයෙන් නිර්දේශ ලබා දී ඇති නමුත් තවමත් බැංකුව එම නිර්දේශ අනුගමනය නොකරන බවත්, බැංකුව සඳහා නිසි බඳවාගැනීමේ පටිපාටියක් තවමත් නොමැති බවත්, බැංකුව සතුව කාර්ය මණ්ඩලය සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් තිබෙන බව සඳහන් කළද, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි අනුප්‍රාප්තික සැලැස්මක් නොමැති බවත්, ඉදිරියේදී මෙම තත්ත්වය වළක්වා ගනිමින් කටයුතු කළ යුතු බවත් වැ.බ විගණකාධිපතිවරයා අවධාරණය කළේය.

**<u>මධ්‍යගත බැංකු පද්ධතිය (Centralized co-banking system)</u>**

බැංකුවේ මධ්‍යගත බැංකු පද්ධතිය (Centralized co-banking system) ආරම්භ කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම දත්ත පද්ධතිය සකස් කිරීමට ඇමරිකානු ඩොලර් මිලියන 12.5 ක් වැය කිරීමට ගිවිසුම්ගතවී, ඩොලර් මිලියන 9ක් පමණ මේ වන විට ගෙවීම් කර තිබියදී, වසරට දෙවරක් ශ්‍රී ලංකා මහා බැංකුවට ලබා දීමට ඇති වාර්තා මාස 06ක් ප්‍රමාද වීම හේතුවෙන් බැංකුව වෙත මූල්‍ය බුද්ධි ඒකකය විසින් රු. මිලියන 35ක දඩ මුදලක් පනවා තිබීම පිළිබඳව කාරක සභාව විමසුවාය.

මීට පිළිතුරු දෙමින් අනුකූලතා අංශයේ ප්‍රධානී පවසා සිටියේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් හේතූන් 03 ක් මත එම දඩ මුදල බැංකුවට පනවා ඇති බවය.

මෙම පරිගණක පද්ධතියේ පරිශීලක පිළිගැනීම (User acceptance) පිළිබඳව පරීක්ෂා කර තිබේද යන්න හා පද්ධතියෙහි සර්වර් (servers) බිඳ වැටුනහොත් කල් යාමකින් තොරව එය නිරාකරණය කර ගැනීමට හැකිද යන්න පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව, මෙම පරිගණක පද්ධතියේ පරිශීලක පිළිගැනීම (User acceptance) පරීක්ෂාව සඳහා ඇමරිකානු ඩොලර් 500,000 ක පළමු ගෙවීම 2023.04.10 දින සිදු කර ඇති බවත්, ඇමරිකානු ඩොලර් 200,000 ක දෙවන ගෙවීම 2024.10.23 දින සිදු කර ඇති බවත්, ඉතිරි මුදල 2024.11.09 දින ගෙවා ඇති බවත්, LOS (Loan Originating System) සඳහා 2023 වර්ෂයේ ඇමරිකානු ඩොලර් 61,518 ක් ගෙවා ඇති බවත්, එසේ තිබියදී වෙනත් සමාගමකට මෙය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන ඇති බවත් නිරීක්ෂණය විය.

මෙම පද්ධතිය තෝරාගැනීමේදී යම් තාක්ෂණික ගැටළු පවතින බව පෙනී යන බවත්, බැංකුව ආරම්භ කර වසර 51ක් ගත වී තිබුණ ද තවමත් මෙම ආයතනයට සුදුසු පරිගණක දත්ත පද්ධතියක් සකස්කර නොමැති බවත්, මෙම තත්ත්වය නිවැරදි කර ගත යුතු බවත් කාරක සභාව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. බැංකුවට සුදුසු පරිගණක පද්ධතියක් කඩිනමින් සකස් කිරීම.

## 04. <u>2022 සහ 2023 වර්ෂවල විගණකාධිපති වාර්තාවලට අදාළව සාකච්ඡා කළ කරුණු</u>

### 4.1 <u>පුද්ගලයන් දෙදෙනෙකු වෙත 2020 දෙසැම්බර් 23 වැනි දින ලබා දී ඇති රු. මිලියන 164.73 ක් වූ බද්ධ දේපළ ණය</u>

පුද්ගලයින් දෙදෙනෙකුට 2020 දෙසැම්බර් 23 වන දින බැංකුව විසින් රුපියල් මිලියන 164.73 ක බද්ධ දේපල ණයක් ලබා දීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කාරක සභාව විසින් සිදු කරන ලදී.

- ණය ආපසු අයකර ගැනීමේ හැකියාව සහතික කිරීම සඳහා ණය ගැණුම්කරුවන්ගේ ආදායම් මූලාශ්‍ර සත්‍යාපනය කිරීම සඳහා බැංකුව යෝග්‍ය ගනුදෙනු ඇගයීමක් සිදු කර නොතිබුණි.
- ආරම්භක අදියරේදී, ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සහ ණය ගැණුම්කරුවන්ගේ ව්‍යාපාරවල අහිතකර තත්ත්වය හේතුවෙන් ණය ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ණය කමිටුව එකඟ වී නොතිබුණද,

පසුකාලීනව, ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් හිඟ මුදල නොසලකා සහ ගනුදෙනුකරුවන්ගෙන් DTA රක්ෂණාවරණයක් ලබාගැනීමෙන් තොරව, ආපසු ගෙවීමේ කාලය අවුරුදු 15 සිට අවුරුදු 20 දක්වා දීර්ඝ කරමින් සහ 75% ක් වූ වටිනාකමට ණය අනුපාතය ඉක්මවමින් ඉහත ණය මුදල ලබා දීමට 2020 සැප්තැම්බර් 09 වන දින පැවති විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබුණි.

- ඉහත සඳහන් කළ විශේෂ රැස්වීම සඳහා එකී ණය මුදල අනුමත කිරීමට විරුද්ධ වූ භාණ්ඩාගාර නියෝජිතයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුට ආරාධනා කර නොතිබුණි. කෙසේ වෙතත්, එක් ණය ගැණුම්කරුවකුගේ සහභාගීත්වයෙන් ඉහත රැස්වීම පවත්වා තිබුණි. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල විනිවිදභාවය ගැටළුසහගත වේ.
- ණය ගැණුම්කරු වාරික දෙකක් පමණක් ගෙවා තිබුණු අතර රු.මිලියන 39.36 ක් වූ වාරික 27 ක් හිඟ තත්ත්වයේ පැවතුණි.
- 2023 මැයි 31 දිනට මුළු අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 164,01 ක් විය.
- 2023 ජූලි 24 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී, ණය මුදලට සුරැකුම් ලෙස උකස් කරන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට අනුමැතිය ලබා දී තිබුණි. වෙන්දේසි ක්‍රියාවලිය හැසිරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) පත් කර තිබුණි. කෙසේ වෙතත්, සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) විසින් 2024 පෙබරවාරි 05 දිනැති ලිපිය මගින් ප්‍රධාන කළමනාකරු (අයකිරීම්) වෙත ඉහතින් කී බලය පවරා ඇති අතර, එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අභිබවා ගොස් තිබුණි.
- බැංකුව විසින් 2024.02.06 දින දේපළ විකිණීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියක් පවත්වා ඇත.
- එහෙත්, අපේක්ෂිත ගැනුම්කරුවන් කිසිවෙකු පැමිණ නොසිටි බැවින්, දේපළ බැංකුවට පවරා ගෙන ඇත. බැංකුව විසින් නැවත දේපළ විකිණීම සඳහා 2024.08.02 දින ටෙන්ඩර් දැන්වීමක් පළ කර ඇති අතර ටෙන්ඩර් පිළිගැනීම 2024.08.23 දින පස්වරු 2.30 ට අවසන් කර ඇත. එක් ලංසුවක් පමණක් ලැබී ඇති නමුත්, එම ලංසුකරු ඉඩම මිලදී ගැනීම ප්‍රතික්ෂේපකර තිබුණි. එබැවින්, දේපළ තවමත් බැංකුව නමින් පවතී.
- 2025 සැප්තැම්බර් 30 දිනට ණය මුදලේ මුළු අයවිය යුතු ශේෂය රුපියල් මිලියන 220.755 ක් විය. කෙසේ වෙතත්, 2024 ජූලි 04 දිනැති තක්සේරු වාර්තාවට අනුව, ඉඩමේ වෙළඳපල වටිනාකම රුපියල් මිලියන 197.4 කි.

2020.10.14 දින කළ තක්සේරුවේදී වෙළඳපල මිල රු. මිලියන 195 ක් වූ බව හා විකුණුම් වටිනාකම රු. මිලියන 190 වූ බවත්, 2020.11.10 දින කළ තක්සේරුවේදී වෙළඳපල මිල රු. මිලියන 218 ක් හා විකුණුම් වටිනාකම රු. මිලියන 210 ක් වූ බවත්, මෙම තක්සේරු කිරීම් තක්සේරුකරුවන් දෙදෙනෙකු විසින් සිදු කර ඇති බවත්, 2020 වර්ෂයේ තක්සේරුවට වඩා 2024 වර්ෂයේ තක්සේරුව වැඩි අගයක් ගත යුතු වුවද, 2020 වර්ෂයේ සිදු කර ඇති දෙවැනි තක්සේරුව වැඩි අගයක් වී ඇති බවත්, ණය ලබා දීමේදී, සාමාන්‍යයෙන් දෙවරක් තක්සේරු නොකරන නමුත්, ලබා දිය හැකි ණය මුදලේ ප්‍රමාණය වැඩි කිරීමට දෙවන තක්සේරුව සිදු කරන්නට ඇති බවත්, එම ණය ලබාගන්නාට ගෙවිය හැකි ප්‍රමාණය අනුව වත්කමේ වටිනාකමින් 75%ක උපරිමයකට යා හැකි වුවද, මෙයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට අනුව වත්කමේ වටිනාකමින් 82%ක ප්‍රතිශතයකට ණය ලබා දී ඇති බවත්, 2020 වර්ෂයෙන් පසුව මෙම තක්සේරුකරුවන්ගේ සංචිතය පිළිබඳව ඇගයීමක් කර දෙවන තක්සේරුව සිදු කර ඇති තක්සේරුකරු සංචිතයෙන් ඉවත් කර ඇති බවටත් සහකාර සාමාන්‍යාධිකාරි (ණය අය කරගැනීම්) කරුණු දැක්වූවාය.

මෙම දෙවන තක්සේරුව බැංකුවේ වියදමින් සිදු කළ යුතු බවට තීරණය කොට ඇති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ කාර්ය සටහන්වලට අවධානය යොමු කළ කාරක සභාව, මෙහිදී අනීතික මැදිහත්වීම් තිබෙන බැවින් ණය අය කරගැනීම පමණක් ප්‍රමාණවත් නොවන බවත් අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම ණය ලබා දීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන අනීතික මැදිහත්වීම පිළිබඳව සහ දේපළ තක්සේරු කිරීම් කටයුතු සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

**4.2 <u>ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් ණය පහසුකම් 10 ක අක්‍රමවත් ආපසු ගෙවීම් සලකා බැලීමකින් තොරව ණය ගැණුම්කරුවෙකුට රුපියල් මිලියන 12.6 ක ණයක් ලබා දීම</u>**

බැංකුව විසින් 2019 සැප්තැම්බර් 23 වන දින ණය ගැණුම්කරුවෙකුට රුපියල් මිලියන 12.6 ක ණයක් ලබා දී තිබූ බවත්, 2024 මැයි 31 දිනට අයවිය යුතු ශේෂය සහ මුළු හිඟ මුදල පිළිවෙලින් රුපියල් මිලියන 12.930 ක් සහ රුපියල් මිලියන 7.664 ක් වූ බවත්, නිවසක් සහ දේපළක් මිලදී ගැනීම සඳහා ඉහත ණය මුදල ලබා දී තිබූ බවත් කාරක සභාවට අනාවරණය විය.

ණය ගැණුම්කරුට අදාළ ණය තොරතුරු කාර්යාංශ වාර්තාවේ සඳහන් ණය පහසුකම් 10 ක අක්‍රමවත් ආපසු ගෙවීම් සලකා බැලීමකින් තොරව සහකාර සාමාන්‍යාධිකාරී (ණය) විසින් මෙම ණය මුදල අනුමත කර තිබූ බවත්, මෙම ණය ගැණුම්කරු විසින් එක් වාරිකයක් පමණක් ගෙවා තිබූ බවත් අනාවරණය විය. 2022 ජූලි 19 වන දින සහකාර සාමාන්‍යාධිකාරී (අයකිරීම්) විසින් දේපළ වෙන්දේසි කිරීම පිළිබඳ අවසන් නිවේදනය ණය ගැණුම්කරු වෙත යවා තිබුණි. බැංකුව විසින් පරාටේ ක්‍රියාමාර්ග ගත් විට, වෙන්දේසිය වැළැක්වීම සඳහා 2023 ජනවාරි 18 වන දින ගණුදෙනුකරු විසින් වාරණ නියෝගයක් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත්, බැංකුව ණය මුදලට එරෙහිව අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට  අපොහොසත් වී තිබූ බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

## 05. <u>වර්තමාන කාර්යසාධනය සම්බන්ධයෙන් සාකච්ඡා කළ කරුණු</u>

### 5.1 <u>බැංකුව විසින් RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමක් වෙත ලබා දී ඇති එක්සත් ජනපද ඩොලර් මිලියන 9ක් වටිනා සම්මේලනික ණය (Syndicate Loan)</u>

මෙම බැංකුව (NSB) සහ මහජන බැංකුව විසින් 2018 ජුනි 14 වන දින මාලදිවයින් සමාගමකට එක්සත් ජනපද ඩොලර් මිලියන 10 ක සම්මේලනික ණය (Syndicate Loan) පහසුකමක් ලබා දී ඇති බවත්, මුළු ණය මුදලින් 90% ක් වන එක්සත් ජනපද ඩොලර් මිලියන 9 ක් සඳහා බැංකුව දායක වී ඇති බවත්, ණය ගැණුම්කරු විසින් කිසිදු ප්‍රාග්ධන ආපසු ගෙවීමක් සිදු කර නොමැති බවත්, 2025 සැප්තැම්බර් 30 වන විට හිඟ පොළිය එක්සත් ජනපද ඩොලර් මිලියන 5.73  වූ බවත්, ඒ අනුව, එම දිනට අය විය යුතු මුළු ශේෂය එක්සත් ජනපද ඩොලර් මිලියන 14.73 ක් (රුපියල් මිලියන 4,455.81 ට සමාන) වූ බවත් කාරක සභාවට අනාවරණය වූ අතර, ඒ සම්බන්ධයෙන් වන පහත නිරීක්ෂණ පිළිබඳව අවධානය යොමු කළාය.

- පශ්චාත් ණය සමාලෝචන යාන්ත්‍රණය පිළිබඳ චක්‍රලේඛ අංක 1641/2015 ට අනුව ණය අනුමත කර මාස තුනක් ඇතුළත ණය පහසුකම පිළිබඳ සමාලෝචනයක් කිරීමට බැංකුව අපොහොසත් වීම.
- පළමු ණය නිදහස් කළ 2018 ජුනි 21 දින සිට බැංකුව විසින් ප්‍රාග්ධනය ආපසු ගෙවීම සඳහා වසරක මූලික සහන කාලයක් ලබා දී තිබුණි. කෙසේ වුවද, විවිධ හේතූන් සඳහන් කරමින් 2018 ජුනි සිට 2022 ජුනි දක්වා කාලය ආවරණය වන පරිදි ප්‍රාග්ධන සහ පොළී ආපසු ගෙවීම් සඳහා මෙම සහන කාලය කිහිප වතාවක් දීර්ඝ කර තිබීම.

2025.11.03 දින දක්වා ඇති දත්තවලට අනුව පළමු අදියරට අදාළව ලබා ගෙන ඇති ණය මුදලින් ඩොලර් මිලියන 0.82ක් පමණක් අය කර ගෙන ඇති බවත්, පොලිය වශයෙන් ලැබී ඇත්තේ ඩොලර් මිලියන 1.96 ක් බවත්, කාරක සභාවට නිරීක්ෂණය විය.

මෙම ව්‍යාපෘතියේ විලා ඉදිකිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් වන පහත දැක්වෙන තොරතුරු පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

| **විලා (Villa) වර්ගය** | **නිමකිරීමේ ප්‍රතිශතය** | |
|---|---|---|
| | **සමාගමේ වරලත් මිනින්දෝරුවරයාගේ ප්‍රමාණපත්‍ර (BOQs) අනුව (2018 දෙසැම්බර් 31)** | **2023 ජනවාරි 2 හා 3 දිනවල සිදුකරන ලද ස්වාධීන තක්සේරුවට අනුව** |
| Garden Villas | 99% | 90% |
| Semi Water Villas | 78% | 30% |
| Beach Villas | 78% | 10% |
| Water Villas | 72% | 0% |
| Front of House | 23% - 93% | 0% - 60% |
| Back of House | 79% - 100% | 0% - 90% |

සමාගමේ වරලත් මිනින්දෝරුවරයාගේ ප්‍රමාණපත්‍ර හා එයට වසර 05කට පසුව සිදු කළ ස්වාධීන පරීක්ෂකගේ වාර්තාව සැසඳීමේ දී අඩු ඉදිකිරීම් ප්‍රමාණයක් සිදු වී ඇති බවත්, ස්ථානීය පරීක්ෂණ 2018 ජුනි 1 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ණය) සහ ආයතනික මූල්‍ය අංශයේ (Corporate Finance Division) ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද බවත්, පසුව 2018 නොවැම්බර් 13 දින එම අංශයේම ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් දෙදෙනෙකු විසින් සිදු කර තිබූ බවත්, විවිධ කාණ්ඩ යටතේ 50% සිට 100% දක්වා වූ ප්‍රගතියක් ස්ථානීය පරීක්ෂණවලින් පෙන්නුම් කර තිබූ බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉදිකිරීම් කටයුතුවල ප්‍රගතිය නිවැරදිව තක්සේරු කිරීමට අත්‍යාවශ්‍ය වන, තාක්ෂණික විශේෂඥතාව ඇති බැංකු ඉංජිනේරුවරයෙකු

ස්ථානීය පරීක්ෂණ කණ්ඩායමට ඇතුළත් කර නොතිබූ බවත් කාරක සභාවට හෙළි විය.

මේ සම්බන්ධයෙන් ගණකාධිකාරී පහත කරුණු සඳහන් කළේය.

- මේ සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා ඇති Pricewaterhouse Coopers (PwC) ආයතනයට රු. මිලියන 9ක් ගෙවා ඇති බව,
- මෙම ණය මුදලද ඇතුළත්ව ප්‍රශ්නගත ණය මුදල් 04 පිළිබඳව නීතිපතිවරයාව දැනුවත් කර ඇති බව හා ඒ සම්බන්ධව සියලු ලිපි ලේඛන යොමු කරන ලෙස ඔහු දැන්වූ බව,
- මෙයට අමතරව ශ්‍රී ලංකා මහා බැංකුව හා මුදල් අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් කළ බව,
- මෙම ණයෙහි පොලිය පමණක් යම් කාලයකට ගෙවීම් කර ඇති බව හා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම් (re-negotiations) පමණක් සිදු වී ඇති බව,
- මේ පිළිබඳව නව රජයෙහි මුදල් අමාත්‍යවරයා සමග ද සාකච්ඡා කළ බව,
- මේ පිළිබඳව පුළුල් පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය බැවින් අදාළ ලේඛන අවශ්‍ය බව අමාත්‍යවරයා දැන්වූ හෙයින්, ඊට අදාළ සියලුම ලිපි ලේඛන යොමු කළ බව,
- මේ සම්බන්ධයෙන් අධ්‍යයනය කළ නීතිපති දෙපාර්තමේන්තුව මෙම ව්‍යාපෘතිය මාලදිවයිනට අයත් දූපත්වල තිබෙන බැවින් ඊට මාලදිවයින් නීතිය අදාළ වන හෙයින් මෙම කරුණ මාලදිවයින් විශේෂඥයෙකුට යොමු කරන ලෙස දැන්වූ බව,
- මෙම ණය සම්මේලනික ණයක් වන බැවින් අනෙකුත් බැංකු සමග ද සාකච්ඡා කිරීමට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරියට දැන්වූ බව,
- මෙම ණය ප්‍රතිව්‍යුහගතකරණය හෝ ආපසු අය කර ගැනීම (recovery) කළ යුතු බව.

කාරක සභාවට පහත කරුණු නිරීක්ෂණය විය.

- ණය ගිවිසුමේ F 30 (r) වගන්තියට අනුව, ණය ගැණුම්කරු විසින් අදාළ රක්ෂණ ඔප්පුවල කල් ඉකුත් වීමේ දිනයට දින තිහකට නොඅඩු කාලයකට පෙර, ප්‍රායෝගික නම්, හෝ ඕනෑම අවස්ථාවක, රක්ෂණ ඔප්පුවේ කල් ඉකුත් වීමේ දිනයෙන් දින හතකට නොඅඩු කාලයකදී රක්ෂණ ඔප්පුව අලුත් කිරීමේ සහතිකය ලබා දිය යුතු වුවද, 2021 ජූලි මාසයෙන් පසු කාලය සඳහා ණය ගැණුම්කරු රක්ෂණ ආවරණය පිළිබඳ සාක්ෂි බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු බව,

- ණය ගිවිසුමට අනුව, අවම වශයෙන් ඇමරිකානු ඩොලර් 270,000 ක ශේෂයක් සහිතව ණය සේවා සංචිත ගිණුමක් (DSRA) විවෘත කර පවත්වාගෙන යායුතු වුවද, ණය ගැණුම්කරු අවශ්‍ය අවම ශේෂය පවත්වා ගැනීමට අපොහොසත් වූ බවත්, 2025 සැප්තැම්බර් 30 වන විට, ණය සේවා සංචිත ගිණුම සතුව ඇමරිකානු ඩොලර් 27,987.69 ක ශේෂයක් පමණක් පැවතුණු බව.

මෙම ණය මුදල නිකුත් කර මාස 03 ක් ඇතුළත එයට අදාළව පසු ඇගයීම් (post review) සිදු කර නොමැති බවත්, උක්ත ඇගයීම සිදු කළේ නම් පසුව නිකුත් කළ අමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 2.25 ක් නිකුත් නොකර සිටිනු ඇති බවත්, වැ.බ විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය.

RPI Private Limited සමාගම ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී තිබේද, මෙම ගනුදෙනුව නියෝජනය කිරීමට ශ්‍රී ලාංකිකයෙකු සිටියේ ද එවැනි සමාගමකට ණය ලබා දීම බැංකු පනතට අනුකූල ද, ලංකාවේ ශාඛාවක් නොමැති, දේශීය නියෝජිතයෙකු ද නොමැති සමාගමකට ණය දුන්නේ කෙසේද යන්න හා මෙයට අදාළව ඇති ඇපකරය කුමක්ද යන්න කාරක සභාව විමසුවාය.

මේ සම්බන්ධයෙන් සහකාර සාමාන්‍යාධිකාරී (ආයතනික ණය) සඳහන් කළේ, බදු රඳවාගැනීමේ අයිතිය පමණක් ඇපකරයක් ලෙස ලබා ගෙන ඇති බවත්, දේපල ඇපකරයක් නොමැති බවත්ය.

බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී විසින් 2018 ජනවාරි 23 දිනැතිව, මෙම ණය ලබා දීමේදී ඉහළ අවදානමක් ඇති බව පෙන්වා දී ඇති බවත්, මෙතරම් දැඩි අවදානමක් තිබියදී මෙම ණය ලබා දීම අනුමත කළ අධ්‍යක්ෂ මණ්ඩලය වරදක් සිදු කර ඇති බවත්, මෙම කටයුත්ත අනුමත කළ පාර්ශවවල ලබැඳියාවන් තිබේද යන්න සොයා බැලීම කළ යුතු බවත්, ඉදිරියේදී මෙවැනි ක්‍රියා වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු බවත් කාරක සභාව අවධාරණය කළාය.

මෙම ණය පිළිබඳව අමාත්‍යාංශයෙන් උපදෙස් පතා 2025 ඔක්තෝබර් මස ලිපියක් යොමු කර ඇති බවත්, මෙම ණය ලබා දීමේදී භාණ්ඩාගාරයේ අනුමැතියක් ලබා දී නොමැති බවත්, මෙය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් බැවින් ණය අය කර ගැනීම කඩිනමින් කිරීමට උපදෙස් ලබා දුන් බවත්, සාමාන්‍යයෙන් ඕනෑම අලාභයක් සිදු වූ විට, මුදල් රෙගුලාසි 104ට අනුව

අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කළ යුතු බවත්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ පරීක්ෂණයක් සිදු කිරීමට කාරක සභා නිර්දේශ අනුව කටයුතු කරන බවත්, ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීමට හැකියාව තිබෙන බවත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී පැවසීය.

ණය සම්බන්ධ කරුණුවලදී නීති අංශයේ මැදිහත්වීමේ ප්‍රමාණය හා එහි නිරවද්‍යතාවය පිළිබඳව ගැටළු පවතින බව කාරක සභාව අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

i. මෙම ණය මුදල අය කරගැනීම සඳහා නීතිපතිවරයාගේ උපදෙස් අනුව නඩු පැවරීමට කටයුතු කිරීම.
ii. RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමට මෙම සම්මේලනික ණය ලබා දීමේ ක්‍රියාවලියේදී බැංකුවේ නිලධාරීන් ක්‍රියාකර ඇති නොසැලකිලිමත් හා වගකීම් විරහිතභාවය පිළිබඳව අවධානය යොමු කර ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීම.
iii. බැංකුවේ නීති අංශය අදාළ කළමනාකරණ තීරණ ගැනීම් ක්‍රියාවලියේදී අවශ්‍ය කටයුතු නිසි ලෙස සිදු කරන්නේදැයි සොයා බැලීමට වැඩි අවධානයක් යොමු කිරීම.
iv. ආයතනයේ නීති අංශයට බඳවාගැනීමට සැලසුම් කර ඇති නව බඳවාගැනීම් කිරීමේදී නිසි ආකාරයෙන් හා නීත්‍යානුකූල පදනම මත කටයුතු කිරීම.
v. ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් මාලදිවයිනේ RPI Private Limited සමාගම වෙත ලබා දී ඇති නැවත අයකර ගැනීමට නොහැකිව පවතින සම්මේලනික ණය (Syndicate Loan) මුදල සම්බන්ධයෙන් පහත කරුණු ඇතුළත්ව විමර්ශනයක් පවත්වන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට/ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම.
    - මෙම ණය ලබා ගත් RPI Private Limited නැමැති මාලදිවයින් සමාගමේ පැවැත්ම පිළිබඳ තොරතුරු
    - එම ණය පහසුකම ලබා ගැනීමට ඉල්ලුම කළ පුද්ගලයින් පිළිබඳව තොරතුරු
    - ණය ලබා දීමේ ක්‍රියාවලියේ පවතින ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධ සම්පූර්ණ තොරතුරු
    - ණය ලබා දීමට අනුමැතිය ලබා දුන් පාර්ශව සමග මෙම සමාගමට ඇති ලබැඳියාවන් සම්බන්ධ තොරතුරු

vi. මුදල් රෙගුලාසි 104ට අනුව මෙම සම්මේලනික ණය ලබා දීම සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීම.

## 5.2 ණය ලිපිගොනු අස්ථානගත වීම

ප්‍රාදේශීය කළමනාකරුවන්ගෙන් ලැබුණු තහවුරු කිරීම්වලට අනුව, 2025 ජුනි 30 දිනට රු. මිලියන 244.647 ක ප්‍රදානය කරන ලද ණයවලට අදාළ ණය ලිපිගොනු 297 ක් අස්ථානගත වී තිබූ බව කාරක සභාවට හෙළි විය.

මේ වන විට මේ සම්බන්ධයෙන් වාර්තාවක් ලබාගෙන ඇති බවත්, ණය ලිපිගොනු 264ක් අස්ථානගත වී ඇති බවත්, එයින් 178ක් පමණ බැංකුවේ කඩුවෙල ශාඛාව 2017 වර්ෂයේ ගංවතුරට හසුවීමෙන් අස්ථානගත වී ඇති ලිපිගොනු වන බවත්, මෙම ලිපිගොනු 264න් 194ක්ම දේපල ණය (property mortgage loan) සහ නිවාස ණය වන බවත්, ඒවායේ ඇපකර (security documents හා mortgage bonds) අඩංගු බැවින් අය කරගැනීමේ දී ගැටළුවක් ඇති නොවන බවත්, එයින් ගිණුම් 147කට පමණ අදාළ ගෙවීම් කරමින් පවතින බවත්, තවද, ශාඛා කිහිපයක ගංවතුරට හසු වී ඇති ලිපිගොනු පවතින බවත්, මෙම සෑම ලිපිගොනුවකටම අදාළ අය කරගැනීම්වලට අදාළ ක්‍රියාමාර්ග ගන්නා බවත්, මෙම ලිපිගොනු සම්බන්ධ තොරතුරු දැනට නව තොරතුරු පද්ධතියට මාරු කර (migrate) ඇති බව හා බැංකුවේ කඩුවෙල ශාඛාව වෙනත් ස්ථානයක ස්ථාපනය කර ඇති බවත් ජ්‍යෝෂ්ඨ සාමාන්‍යාධිකාරී ප්‍රකාශ කළේය.